**<u>කොළඹ මහාධිකරණ අංක 04 දීය.</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ඒ.කේ.එම්.පටබැඳිගේ මැතිතුමා ඉදිරිපිටදී ය.</u>**

**කොළඹ මහාධිකරණ නඩු අංකය: HCEBA/1335/2023**

**කොටුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B/25774/2023**

**සටහන් ගැනීම ල/ලේ .ඉරේෂා ප්‍රියදර්ශනි මෙය විසිනි.**

**දිනය: 2023.07.05**

2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සි.පි.ආර්.) පනතේ 3(4) වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ඇප ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වන කාරණාවේදීය.

ස්ථානාධිපති,
අන්තර්ජාල ආවේක්ෂණ හා බුද්ධි ඒකකය,
පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාශය,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

<u>පැමිණිලිකරු</u>

**එදිරිව**

**එදිරිසූරිය ආරච්චිගේ ජයනි නතාෂා එදිරිසූරිය,**

**අංක 81, පහලගම, වේවැල්දෙණිය.**

**<u>සැකකාරිය.</u>**

---

සහ දැන්/අතර,

**එදිරිසූරිය ආරච්චිගේ ජයනි නතාෂා එදිරිසූරිය,**

**අංක 81, පහලගම, වේවැල්දෙණිය**

**<u>පෙත්සම්කාරිය</u>**

**එදිරිව**

ස්ථානාධිපති,

අන්තර්ජාල ආවේක්ෂණ හා බුද්ධි ඒකකය,

පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාශය,

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,

කොළඹ 01.

<u>පැමිණිලිකාර වගඋත්තරකරු</u>

ගරු නීතිපතිතුමා,

නීතිපති දෙපාර්තමේන්තුව,

කොළඹ 12.

<u>වගඋත්තරකරු</u>

**එදිරිසූරිය ආරච්චිගේ ජයනි නතාෂා එදිරිසූරිය,**

**අංක 81, පහලගම, වේවැල්දෙණිය**

**(දැනට වැලිකඩ රක්ෂිත බන්ධනාගාරයේ රඳවා සිටින)**

**<u>සැකකාර වගඋත්තරකාරිය.</u>**

# <u>ඇප නියෝගය</u>

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලමි. ජොෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්තුමා ඇප ලබාදීමට විරුද්ධ නොවන බව පවසා සිටියද 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතෙහි 4 වන වගන්තිය අනුව ඇප නියම කළ හැකිවන්නේ සුවිශේෂි කරුණු තිබේනම් පමණි.

ඇප ලබාදිමට නීතිපතිවරයා වෙනුවෙන් විරුද්ධ නොවිමම ඇප දීමට හේතුවක් නොවේ. එහිදී අධිකරණය සුවිශේෂි කරුණු ඇති බවට අධිකරණමය වශයෙන් සෑහිමට පත්විය යුතුය.

2007 අංක 56 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව ජාත්‍යන්තර සම්මුති පනතෙහි 3(1) වගන්තියෙහි මෙසේ සඳහන් වේ.

**“ කිසිම තැනැත්තෙකු විසින් යුද්ධය පැතිර වීම හෝ වෙනස් ලෙස සැලකීමට එදිරිවාදීකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම සඳහා ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පැතිරවීම සිදු නොකළ යුතුය”**

විශේෂයෙන්ම අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත වර්ෂ 2007.10.10 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් එවකට විදේශ ඇමතිවරයා වශයෙන් කටයුතු කරන ලද රෝහිත බෝගොල්ලාගම අමාත්‍යවරයා මෙම පනත ගෙන ඒමේ පරමාර්ථය පවසා ඇත. ඒ අනුව 1980 දී ශ්‍රී ලංකා රජය රජයක් වශයෙන් අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනතට අත්සන් තබා තිබුණද අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන

නොමැති නමුත් අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනතේ සඳහන් ඇතැම් අයිතිවාසිකම් ලංකාව තුළ නීතිමය වශයෙන් බලධාරී කිරීම එහි පරමාර්ථය බවට සඳහන් කර ඇත.

අප පනතේ 3 වන වගන්තිය අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 20 වන වගන්තියේ දෙවන උපවගන්තියට සමාන වේ. මෙය අර්ථ දැක්විය යුත්තේ අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියෙහි 19 වන වගන්තිය හා සමග බව පිළිගත් කරුණකි. එනම්, භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස තුළ මෙය අර්ථ දැක්විය යුතු බවට නීතිය පිළිඅරගෙන ඇත.

මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය වෛරී ප්‍රකාශන සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් 2020 සැප්තැම්බර් මස පිළියෙල කර ඇති අතර එහිදී වෛරී ප්‍රකාශන කොටස් තුනක් වශයෙන් හඳුනාගෙන ඇත.

එනම්,

1. සමූල ඝාතනයන් සිදුවන ආකාරයේ බරපතල ප්‍රචාරයන් කරනු ලබන වෛරී ප්‍රකාශන. (The Severest Former Of Hate Speech)
2. මධ්‍යම මට්ටමේ වෛරී ප්‍රකාශන. (Intermediate Level)
3. ඉතා අඩු මට්ටමේ(Bottom Level) ප්‍රකාශ

විශේෂයෙන්ම යම්කිසි ප්‍රකාශයක් වෛරී ප්‍රකාශයක්ද නැද්ද යන්න තීරණය කිරීමේදි එකී ප්‍රකාශය මගින් ඉලක්කගත කණ්ඩායමක් වෙනස්කමකට ලක්කිරීම සඳහා උසිගැන්වීමක් (Incitement To Discrimination) තිබිමට නම් වෛරී ප්‍රකාශය කරන්නා (Hate Speaker), ප්‍රේක්ෂකාගාරය ( An Audience)

සහ ඉලක්ක ගත කණ්ඩායම් (Target Group) තිබිය යුතු බව මා ඉහතින් විස්තර කරන ලද වෛරී ප්‍රකාශන පිළිබඳ එක්සත් ජාතීන්ගේ උපක්‍රම සහ ක්‍රියාකාරී සැලැස්ම (United Nations Strategy and Plan of Action on Hate Speech) 2020 සැප්තැම්බර් මස ප්‍රකාශයෙහි සඳහන් කර ඇත.

ඒ අනුව වෛරී ප්‍රකාශයට සම්බන්ධ වූ ප්‍රේක්ෂකයින් විසින් ඉලක්කගත කණ්ඩායම විෂයෙහි සතුරුකමට සහ ප්‍රචණ්ඩත්වයට පත්කිරීමේ ක්ෂණික තර්ජනයක් තිබිය යුතුය.

නමුත් මෙම ඇප අයදුම්පතට අදාල සැකකාරිය 2023.04.01 දින කරන ලද ප්‍රකාශය කළේ යැයි කියනු ලබන වැඩසටහනට සහභාගි වූ ප්‍රේක්ෂකයින් විසින් එවැනි ප්‍රචණ්ඩත්වයක යෙදුණු බවට කිසිදු සාක්ෂියක් තොරතුරු වාර්තාවේ සඳහන් නොවේ.

අනෙක් අතට යම්කිසි ප්‍රකාශයක් වෛරී ප්‍රකාශයක්ද නැද්ද යන්න සම්බන්ධයෙන් සලකා බැලීමේදී අනුගමනය කළ යුතු නිර්ණායකයන් 2012 ඔක්තෝම්බර් මාසයේදි මොරොක්කෝවේ රබාට් නගරයේදී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය පැවැත්වූ සැසිවාරයේදි හඳුන්වා දී ඇති රබාට් ක්‍රියාකාරී සැලැස්ම (Rabat Plan of Action) වැදගත් වේ. එහිදි යම්කිසි ප්‍රකාශයක් වෛරි ප්‍රකාශයක්ද නැද්ද යන්න හඳුනාගැනීම සඳහා නිර්ණායකයන් 6 ක් සඳහන් කර ඇත.

1. සන්දර්භය (Context)

- එහිදී මෙම ප්‍රශ්නගත ප්‍රකාශය කරනු ලබන අවස්ථාව වන විට පවත්නා වූ ගැටුමක් එනම්, ඉලක්ක ගත කණ්ඩායම අරභයා ගැටුමක් නිර්මාණය වී තිබේද?
- එකී ඉලක්කගත කණ්ඩායම නීතිය විසින් වෙනම පිළිගෙන තිබේද?
- ජාත්‍යන්තර මානව හිමිකම් සිද්ධාන්තයන්ට අනුව වෙනස් කොට දැක්වීම වැළැක්වීමේ නීති එම රට තුළ ක්‍රියාත්මක වන්නේද?
- මාධ්‍ය එකී ඉලක්ක ගත කණ්ඩායම අරභයා කෙසේ හැසිරී ඇත්ද?
- ස්වාධීන මාධ්‍යක් තිබේද?
- මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබේද?
- එකී මැතිවරණය තුළ මෙම ඉලක්කගත කණ්ඩායම කෙසේ කටයුතු කරන්නේද?

යන කරුණු වලට ලැබෙන පිළිතුරු අනුව මෙම සන්දර්භය සලකා බැලිය යුතු බවට සඳහන් කර ඇත.

2. කථානායකයා (speaker) එනම්, වෛරී ප්‍රකාශය කළේ යැයි කියනු ලබන තැනැත්තාට සමාජය තුළ ඇති පෙළඹවීමේ බලය ඔහු ජාතික නායකයෙක්ද, දේශපාලනඥයෙක්ද, රජයේ නිලධාරියෙක්ද, ආගමික නායකයෙක්ද, සමාජ මාධ්‍ය ක්‍රියාකරුවෙක්ද, සමාජය තුළ ඔහුට

පවතින කීර්ති නාමය හා එකී කථානායකයා සහ ඉලක්කගත කණ්ඩායම අතර පවතින සබඳතාවය.

3. කථානායකයා තුළ තිබූ චේතනාව.(Intention)
4. එහි අන්තර්ගතය සහ ඊට අදාල රාමුව.(Content and Form)
5. එම ප්‍රකාශයේ විශාලත්වය සහ ප්‍රමාණය. (Extent and Magnitude of the Expression)
6. එකී ප්‍රකාශය තුළ ඉලක්කගත කණ්ඩායමක් අරඹයා යම් උසිගැනීවීමේ ක්‍රියාවලියක් තිබුණේද? (Likelihood Including Imminence To Incite)

ඒ අනුව මෙම නතාෂා එදිරිසූරිය නමැති මෙම ඇප අයදුමට සම්බන්ධ සැකකාරිය සලකා බලන විට මෙම ප්‍රකාශය කළේ යැයි කියනු ලබන කාල සීමාව තුළ බෞද්ධයන් අරහයා ගැටුම්කාරී තත්ත්වයක් සමාජය තුළ තිබුණු බවට මුල් තොරතුරු වාර්තාවේ සඳහන් කර නැත. එසේම කථානායිකාවට සමාජය තුළ පිළිගැනීමක් තිබුණේද නැද්ද යන්න සම්බන්ධයෙන් සලකා බලන විට මෙම ප්‍රකාශය ඇතුළත් මෝඩාභිමානය නමැති වැඩසටහන You Tube නාලිකාවට ඇතුළත් කරන තුරු එවැන්නියක සමාජය තුළ සිටින්නේද නැද්ද යන්න සම්බන්ධයෙන් දැනුමක් තිබුණු බවට මෙම බී වාර්තාවෙන් පැහැදිලි නොවේ.

එසේ ඉලක්කගත කණ්ඩායම සලකා බලන විට මෙම පෙත්සම්කාරිය වෙනුවෙන් CD පටයක් ඉදිරිපත් කර තිබූ අතර, එහි අධිකරණය නිරීක්ෂණය කළේ එම වැඩසටහනට සහභාගී වූ ප්‍රේක්ෂකයන් හුදෙක් සිනහ වීම සඳහා හෝ විනෝදය සඳහා සහභාගී වූ පුද්ගලයන් පමණක් බවයි. එම 2023.04.01 වන දින

සිදු වූයේ යැයි කියනු ලබන මෙම වැඩසටහනින් පසු එහි ප්‍රේක්ෂකයන් ඉලක්ක ගත කණ්ඩායම අරහයා එසේ නොමැති නම් ඉලක්ක ගත කණ්ඩායම වන බෞද්ධයන්ට එරෙහිව කිසියම් හෝ උසිගැනීමක් එනම්, සතුරුකම් කිරීමක් හෝ ප්‍රචණ්ඩත්වය වැපිරීමක් (Hostility or Violence) සිදු කර ඇති බවට කිසිදු සාක්ෂියක් බී වාර්තාවෙන් තහවුරු නොවේ.

ඇතැම් පුද්ගලයන් කරනු ලබන ප්‍රකාශයක් මගින් යම් යම් සමාජ කොටස්වලට, ජාතීන්ට ආගමික කණ්ඩායම් වලට අවවරප්‍රසාදිත කණ්ඩායම් වලට හිත්රිදවීම් සිදු විය හැකිය. එසේම යම් යම් අපහාසාත්මක කරුණුද සිදු විය හැකිය. නමුත් එවැනි සිත් රිදවීමක් සිදුවූ පමණින්ම හෝ අපහාසයක් සිදු වූ පමණින්ම හා ප්‍රකාශකයා හෝ ප්‍රකාශිකාව නොසැළකිලිමත් ලෙස වගකීම් විරහිතව ප්‍රකාශයක් කල පමණින් එය අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනතේ 3(1) වගන්තියට අදාල නොවන බවට අන්තර් ජාතික නීතිය පිළිගෙන ඇති තත්ත්වයකි.

මේ අනුව මෙම නතාෂා එදිරිසූරිය නමැති සැකකාරිය වැඩසටහනේදි කළ සමස්ථ ප්‍රකාශය සලකා බැලීමේදි එය කිසිසේත්ම බෞද්ධයන් ඉලක්ක කරගෙන ඔවුන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය හෝ සතුරුකම් කිරීමේ අරමුණින් එහි ප්‍රේක්ෂකයන් උසිගැන්වීමේ ක්‍රියාවලියක යෙදුණු බවට පෙනි නොයයි. එබැවින් අන්තර් ජාතික සිවිල් හා දේශපාලන සම්මුති පනතේ 3(1) වගන්තිය මෙම සැකකාරිය කෙරෙහි යොදා ගත්තේ කෙසේද යන්න බරපතල ගැටළුවකි.

එසේම දණ්ඩ නිති සංග්‍රහයේ 291 (ආ) ආ) සහ 291 (අ) වගන්ති මෙසේ සඳහන් වේ.

**291(අ) "යම් තැනැත්තකුගේ ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත අදහසින් එකී තැනැත්තාට ඇසෙන ලෙස යමකු යම් වචනයක් කියතහොත් හෝ ශබ්දයක් කළහොත් හෝ එකී තැනැත්තාට පෙනෙන පරිදි යම් සංඥාවක් කරතොත් හෝ එකී තැනැත්තා අභිමුඛයෙහි යම් ද්‍රව්‍යයක් තබතොත් ඔහුට අවුරුද්ද දක්වා කාලයක දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළයුතුය.**

**291(ආ) මහරජතුමාණන්ගේ යටත් වැසියන් පංතියක ආගමික හැඟීම් කෙලෙසීම සඳහා ඒකාන්ත හා ද්වේශ සහගත අදහසින් භාෂිත හෝ ලිඛිත වචනයෙන් හෝ දැකිය හැකි නිරූපණ වලින් එකී පංතියේ ආගමට හෝ ආගමික විශ්වාස වලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළයුතුය.**

මෙම 291 අ වගන්තියට සමාන ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයේ 295(අ) වගන්තිය අර්ථදක්වමින් Gour සිය PENAL LAW OF INDIA නමැති ග්‍රන්ථයේ 11 වන සංස්කරණයෙහි 3 වන වෙළුමේ 2335 පිටුවේ Deliberate and Malicious Intention යන්න සම්බන්ධයෙන් කර ඇති පහත සටහන වැදගත් වේ.

"An act may be deliberate without being malicious and it may be Malicious without being deliberate, since it may be reckless without being intentional. What is required to constitute the offence is the presence of both"

මේ අනුව හුදෙක් යම් ජාතියකට හෝ ආගමකට හෝ කණ්ඩායමකට සිත් රිදවන ප්‍රකාශයක් කළ පමණින් ICCPR පනතේ 3 වන වගන්තිය යටතේ පමණක් නොව දණ්ඩ නීති සංග්‍රහයේ 291(අ) වගන්තිය යටතේද කටයුතු කිරීමට හැකියාවක් නැත.

විශේෂයෙන්ම බෞද්ධ භික්ෂූන් හෝ වෙනත් ආගමික නායකයෙක් හෝ සමාජයේ පෙළඹවීමේ බලයක් තිබෙන පුද්ගලයෙකු (Influential Person) පැමිණිල්ලක් කල පමණින්ම ඒ මත පිහිටා පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම විමර්ශකයෙකුගේ කාර්යය භාර්ය නොවේ. විශේෂයෙන්ම අපරාධ නඩු විධාන පනතේ 116 වන වගන්තිය යටතේ විමර්ශනයක් කරන ලද නිලධරයෙකුට ඉදිරිපත් කරන තොරතුර පිළිගත හැකි කරුණු මත පදනම්ව තිබේනම් හා ඔහු සංඥෙය වරදක් කර තිබේනම් වරෙන්තුවක් රහිතව අත්අඩංගුවට ගත හැකිය.

මෙම නඩුවේ කරුණු අනුව විමර්ශකයෙකුගේ කාර්යය භාර්යය වන්නේ අප රටේ අන්තර් ජාතික වගවීම හා බැඳියාවන් අනුව සත්‍ය වශයෙන්ම අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනතේ 3 වගන්තිය යටතේ වෛරී ප්‍රකාශයක් සිදු වී තිබේද නැද්ද යන්න සම්බන්ධයෙන් අන්තර් ජාතික අර්ථ නිරූපණයන්ද සලකා බලා කටයුතු කිරීම විනා පුද්ගලයෙකු පැමිණිල්ලක් ලද පමණින්ම අත්අඩංගුවට ගැනීම නොවේ.

විශේෂයෙන්ම අන්තර් ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් රෝහිත බෝගොල්ලාගම ඇමතිවරයා කර ඇති ප්රකාශයෙන් අප රට ජාත්‍යන්තර වශයෙන් වන වගකීම පිළිබඳ සඳහන් කර ඇත. ඒ අනුව මෙම පනතේ ක්‍රියාවේ යෙදවීමේදීද නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ යුක්තිය පසිඳලන ආයතන වලට එකී අන්තර්ජාතික වගවීම පිළිබඳව පාර්ලිමේන්තුවේ, නොඑසේ නම් ව්‍යවස්ථාදායකයේ චේතනාව මුදුන්පත් වන ආකාරයට කටයුතු කිරීමේ වගකීමක් ඇත. එසේම අධිකරණයකද වගකිම වන්නේ විමර්ශන නිලධාරීන් එනම් පොලිස් නිලධාරීන් සංඝය වරදක් සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමේදී එම සැකකරු හෝ සැකකාරියට ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් අධිකරණමය මනසකින් කටයුතු කර ඉදිරි පියවර ගැනීම විනා විමර්ශකයන් ඉදිරිපත් කළ පමණින්ම රක්ෂිත බන්ධනාගාර ගත කිරීම නොවන බවටද සටහන් කළ යුතුය.

මේ අනුව අද දින උගත් ජොෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර්වරයාද තම කරුණු දැක්වීමේදි පාදක කරගත්තේ සැකකාරිය විසින් කරන ලද ප්‍රකාශය බවට පෙත්සම්කාරිය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශයම වේ. එම ප්‍රකාශය සමස්ථයක් ලෙස ගත් කළ එය කිසිදු ලෙසකට බෞද්ධ සමාජය ඉලක්ක කරගත් වෛරී ප්‍රකාශයක් ලෙසට බැලූ බැල්මට පෙනී නොයයි.

එබැවින් මෙම කරුණම මෙම සැකකාරිය ඇප මත මුදා හැරීමට තරම් සුවිශේෂී කරුණක් බවට මම තීරණය කරමි.

එබැවින් මෙම ඇප අයදුම්පතට අදාලව මෙම සැකකාරිය විසින් කලේ යැයි කියනු ලබන ප්‍රකාශ බැලූ බැල්මට අන්තර් ජාතික සිවිල් හා දේශපාලන

අයිතිවාසිකම් සම්මුති පනතේ 3(1) වගන්තිය යටතේ වෛරී ප්‍රකාශයක් ලෙස බැලූ බැල්මට පෙනී නොයන හෙයින් මෙම සැකකාරිය මේ වනතෙක් රක්ෂිත බන්ධනාගාරගතව සිටීමද සුදුසු තත්ත්වයක් නොවන බවට මම තීරණය කරමි.

ඒ අනුව සැකකාරිය රුපියල් ලක්ෂයක පුද්ගලික ඇප මත මුදා හරින ලෙස උගත් මහේස්ත්‍රාත්වරයාට නියම කරමි.

අද දින ඇප නියෝගයේ පිටපත් ගාස්තුවට යටත්ව පෙත්සම්කාරියටද, ගාස්තු රහිතව වගඋත්තරකරුවන්ටද ලබාදෙන ලෙසත්, අද දින නියෝගය අදාල මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කරන ලෙසත් මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියට නියම කරමි.

**(ඒ.කේ.එම්. පටබැඳිගේ )**
**මහාධිකරණ විනිසුරු,**
**මහාධිකරණය - අංක 04**
**කොළඹ.**
**2023.07.05**